# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1759/26 – 2012 මැයි 23 වැනි බදාදා – 2012.05.23

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: T23/CO/210/2004.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 3 (1) (ඈ) වගන්තිය යටතේ 2009.04.06 දිනැති හා අංක 1596/3 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද එක් පාර්ශ්වයක් වශයෙන් බදුල්ල, බදුලුපිටිය, අංක බී/80හි ටී. කේ. එම්. චන්ද්‍රාවතී මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2012.03.28 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 අප්‍රේල් මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණයේ දී ය.

ටී. කේ. එම්. චන්ද්‍රවතී මහත්මිය, අංක බී/80, බදුලුපිටිය, බදුල්ල.

ඉල්ලුම්කරු

නඩු අංකය: ඒ 3280

හා

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, 200, කිරුළ පාර, කොළඹ 05.

වගඋත්තරකරු

අතර පවත්නා කාර්මික ආරාවුල පිළිබඳව,

ප්‍රදානයයි

ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන පරිච්ඡේදය වන, කාර්මික ආරවුල් පනතේ (1957 අංක 62 හා අංක 4/1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික අණපනත්වල විශේෂ ප්‍රතිපාදන පනත්) වලින් සංශෝධිත 4(1) වගන්තියෙන් ගරු කම්කරු ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව, ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2009.03.31 දින බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකොට ඇත.

අදාළ කාර්මික ආරාවුලට හේතු වූ කරුණ වූයේ,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් බදුල්ල ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ දිසා ගිණුම් නිලධාරි තනතුරෙහි වැඩ ආවරණය කිරීම සඳහා වැඩ බැලීමේ දීමනාවක් සහිතව 1997.10.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි බදුල්ල බස් සමාගමට අනුයුක්තව සේවය කරන ටී. කේ. එම්. චන්ද්‍රාවතී මහත්මියට ලබාදුන් තනතුර 2002.07.02 දින සිට අහිමි කර වෙනත් අයකු එම තනතුරට පත් කිරීම හේතුවෙන් ටී. කේ. එම්. චන්ද්‍රාවතී මහත්මියට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා එලෙස අසාධාරණයක් වූයේ නම් ඇයට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳවද වේ.

පරීක්ෂණය ආරම්භයේදීම කාර්මික ආරාවුල් පනතේ සම්පාදිත නියෝග සංග්‍රහයේ 21(1) දරන නියෝගය පරිදි දෙපාර්ශ්වයේ විස්තරාත්මක ප්‍රකාශ කැඳවීමෙන් අනතුරුව පිළිතුරු ලබාගෙන ඒවා හුවමාරු කිරීමෙන් අනතුරුව සමථයක් නොමැති බැව් ප්‍රකාශවීමෙන් පසු විභාගය ආරම්භ කරන ලදී. ඉල්ලුම්කාරිය වෙනුවෙන් නීතිඥ දීප්ති ගුරුගේ මහතා සහ වගඋත්තරකරුවන් වෙනුවෙන් නීතිඥ කේ. ජී. ලයනල් මහතා ද පෙනී සිටියහ.

පළමුවෙන්ම ඉල්ලුම්කාරිය තම නඩුව ආරම්භ කරමින් සාක්ෂි දී සිටියාය. ඇය 1986.06.10 වන දින සිට ලිපිකාරිනියක් ලෙස පත්වීම් ලද බවත්, 1995.08.11 සිට V වන ශ්‍රේණියේ ගිණුම් නිලධාරි තනතුරට පත් වූ බවත් කියා සිටියාය. ඊට පසුව 1997.10.24 සිට III B වන ශ්‍රේණියේ දිසා ගණකාධිකාරි තනතුරට පත්වීම් ලැබී වැඩ බලන දීමනාවක් වශයෙන් රු. 1000ක දීමනාවක් ද ලද බවත්, 2001/අංක 2 දරන සේවක මණ්ඩල කොට්ඨාස චක්‍රලේඛ පරිදි අදාළ ගණකාධිකාරි තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වූ බව ද කීවාය. සිය සාක්ෂි ඉදිරිපත් කරන අතරතුර ඉල්ලුම්කාරිය 1997.10.24 දින දෙනු ලැබූ දිසා ගණකාධිකාරි තනතුර ඊට අදාළ III බී ශ්‍රේණිය හිඟ වැටුප් රහිතව ලබා දෙන ලෙස ද ඇය දැනට ලබන වැටුප තමා ඉල්ලා සිටින ලද III බී ශ්‍රේණියේ ආරම්භක වැටුපට වඩා ඉක්මවා ගොස් ඇති බවත්, ඊට අදාළ වේතනාධිකය ඊළඟ වර්ෂයේ දී ලබාදෙන ලෙස ද ඉල්ලා සිටියාය.

ඉල්ලුම්කාරිය 1997.10.24 සිට ආවරණය කරන ලද දිසා ගිණුම් නිලධාරි තනතුර සඳහා 2002.03.22 දින සිට වෙනත් අයකු පත්කළ ද තමා වැඩබලන තනතුරින් නීත්‍යානුකූල පරිදි ඉවත් නොකොට තැබීම සම්බන්ධයෙන් තමා ශ්‍රී ලංගම මූල්‍ය පාලක වෙත පැමිණිලි කළ පසුව එකී තනතුරින් හා සේවා ස්ථානයෙන් මාරු කළ බව ද කියා සිටියාය.

අතරතුර දිසා ගිණුම් නිලධාරි තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වන්නට යෙදුණු බවත් ඒ සඳහා තමන් සමග තවත් දෙදෙනෙකු ඉදිරිපත් වූ බවද, එකී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ දී තමන් උපරිම ලකුණු ලබා ඇති බැවින් තමන් දරන වැඩ බලන තනතුර ස්ථිර පත්වීමක් ලෙස ලැබෙන බවට ස්ථිර අපේක්ෂාවෙන් පසුවූ බව ද කීවාය.

නමුත් 2002.03.27 දිනැති ඒ03 ලෙසින් සළකුණු කරන ලද ලිපිය ඉදිරිපත් කරමින් ඔබේසේකර නම් අයෙකුට තමා අපේක්ෂාවෙන් හා ආවරණය කරමින් සිටි තනතුර ලබා දී ඇති බව ද ඇයට අවශ්‍ය සුදුසුකම් නොතිබූ බවත්, ඒ සම්බන්ධව ඇය ශ්‍රී ලංගම විනය පාලක වෙත පැමිණිලි කළ පසු ඇයට වෙනත් සේවා ස්ථාන මාරුවක් ලබා දී විනය පරීක්ෂණයක් පැවැත් වූ බවත්, තමා ලබාගත් ප්‍රසූත නිවාඩු සම්බන්ධව 'පඩි රහිත නිවාඩු' ලබා ගැනීම චෝදනාව යටතේ විනය පරීක්ෂණයක් පැවැත්වූ බවත් තමාගේ අභියාචනය පිළිගෙන චෝදනාවන් වගඋත්තරකාර පාර්ශ්වය ඉල්ලා අස්කර ගත් බවත්, කීවාය. ඒ 06 දරන ලිපිය මගින් සියලු දඬුවම් ඉවත්කර ගත් බව සාක්ෂාත් කළාය.

ඔබේසේකර මහත්මිය වර්ෂ 2007 දී විශ්‍රාම ගැන්වූ බවත්, එහෙත් එම තනතුරට තමා පත් නොකළ බවත් තමන් දරන ලද දිසා ගිණුම් නිලධාරි තනතුරට ඇය පත් කිරීම තමාට කරන ලද බලවත් හානියක් බවත් එම තනතුර සඳහා තමා තුළ අපේක්ෂාවක් පාලක පක්ෂය විසින් සම්මුඛ පරීක්ෂණයේ දී පවා ඇති කළ බවත්ය. එපමණක් නොව ඔබේසේකර මහත්මියට පත්වීම ලබාදීමෙන් ඉල්ලුම්කාරියගේ තනතුර පහත හෙළීමකට පත්වූ බවද සාක්ෂාත් කළාය. තම නතතුරට අදාළ ශ්‍රේණිය ද පහත හෙළීමකට පත්වූ බවත් 2011.01.24 දින මූලික සාක්ෂි විභාගයේ දී (16 පිටුව) ඉල්ලුම්කාරිය කියා සිටියාය.

2011.01.24 දින 17 පිටුව

ප්‍ර. තනතුර අහිමි කිරීමෙන් සහ තමාගේ ශ්‍රේණිය පහත දැමීමෙන් තමන් එවකට ලැබූ වැටුපට වඩා අඩු වැටුපක් තමයි ලැබුණේ නේද?

උ. ඔව්.

ප්‍ර. අඩු වුණේ කොපමණ ප්‍රමාණයක් ද?

උ. රු. 1000ක දීමනාව අඩු වුණා.

ප්‍ර. වැටුප් පරිමාණය අඩු වුණාද?

උ. ඔව්, මම සිටියේ III වන ශ්‍රේණියේ. මාව දැම්මේ V වන ශ්‍රේණියට. ඒ අනුව වැටුප් පරිමාණය අඩු වුණා.

මෙම නඩුවේ ඉල්ලුම්කාරිය තමාට වෘත්තීය ගණකාධිකාරිවරයෙකුට අවශ්‍ය සුදුසුකම් තිබූ බවත් තමා දරමින් සිටි දිසා ගණකාධිකාරි තනතුර දරමින් සිටියදීම වෙනත් මහත්මියක් තම තනතුරටම පත්කළ බවත් ඊට සමගාමීව විනය පරීක්ෂණයක් පැවැත්වීමට පියවර ගත් බවත් විනය පරීක්ෂනයෙන් වරදකරු වුව ද අභියාචනය මගින් නිදොස් හා නිදහස් වූ බවත් එනමුත් තමාගේ තනතුරට පත් ඔබේසේකර මහත්මිය විශ්‍රාම ගිය ද තමාට දිසා ගණකාධිකාරි තනතුර ලබා නොදුන් බවත් සාක්ෂාත් කළාය. (2011.03.01 දින කාර්යය සටහන් 06 පිටුව)

තවදුරටත් ඉල්ලුම්කාරිය සාක්ෂි දෙමින් අවුරුදු 05ක් තමා දිසා ගණකාධිකාරි තනතුර ආවරණය කළ බව (2011.03.01 පිටුව 11) සාක්ෂි දැරුවාය. 2002.07.02 දින වෙනත් අයෙකු තමා දරමින් සිටි දිසා ගණකාධිකරි තනතුර සඳහා පත් කළ බවද 2001.04.26 දින අදාළ තනතුර පිරවීම වස් සම්මුඛ පරීක්ෂණයක් පැවති බවද ඊට සහභාගි වූ තිදෙනාගෙන් උපරිම සුදුසුකම් පැවතියේ තමාට බවද සාක්ෂි දුනි. දිසා ගණකාධිකාරි තනතුර සම්බන්ධයෙන් පැවති සම්මුඛ පරීක්ෂණය හා අදාළ 2001 අංක 02 දරන චක්‍රලේඛය ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් නිකුත් කරන ලද්දකි. සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට එය ඉල්ලුම්කාර පාර්ශ්වයට අත්‍යවශ්‍ය වූවකි. එහෙත් එය වග උත්තරකාර ආයතනයේ නොමැති බවත් ඒ සඳහා වගඋත්තරකරු සාක්ෂිකරුවකු කැඳවිය හැකි බවත් පිළිගත්තේය.

වග උත්තරකාර ආයතනය වෙනුවෙන් සාක්ෂිදුන් චමිලා ජයසිංහ නමැති අය මෙසේ සඳහන් කළාය.

ප්‍ර. 2007.10.24 දින වන විට බදුල්ල ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ දිසා ගණකාධිකාරී තනතුරට අනුයුක්තව සිටින්නේ කවුරුන් ද?
උ. මම දන්නේ නැහැ.

ප්‍ර. වෙනත් කෙනෙක් පත් කළා ද?

උ. දන්නේ නැහැ.

මෙම සාක්ෂිකාරිය වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි දීමට පැමිණ සිටිය ද ඉල්ලුම්කාරිය වෙනුවෙන් අසන ලද ප්‍රශ්නවලදී දුන් පිළිතුරු ඉවතලිය නොහැක.

එනමුත් තවදුරටත් සාක්ෂි දීමේ දී 'ඒ 2' දරන ලේඛනය බලමින් එම ලිපිය මෙම නඩුවේ ඉල්ලුම්කාරියට දුන් ලිපියක් බවත්, ඒ මගින් ඇයට 'V ශ්‍රේණියේ ගණකාධිකාරි' තනතුරක් සඳහා උසස්වීමක් ලබා දී ඇති බවත් 'ඒ 03' ලේඛනය අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි 'VI ශ්‍රේණියේ ලිපිකාරිනියක්ව' සිටි චිත්‍රා ඔබේසේකර මහත්මිය දිසා ගණකාධිකාරි තනතුරට පත් කළ බවත් එකී පත්වීම ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ වැඩ බලන සේවක මණ්ඩල කළමනාකරු විසින් කර ඇති බවත් 'ඒ 01' මත එකී තනතුරට 1997.10.24 දින සිට මෙම නඩුවේ ඉල්ලුම්කාරියව පත් කර තිබූ බවත් 'ඒ 03' ලිපියෙන් ඔබේසේකර මහත්මිය පත්කර ඇත්තේ 2002.03.22 දින බවත් තහවුරු කරමින් සාක්ෂි දුන්නාය.

එම සාක්ෂිකාරිය තවදුරටත් සාක්ෂි දෙමින් මෙසේ කීවාය.

ප්‍ර. 1997 සිට 2002.03.22 දින වනතුරු මේ දිසා ගණකාධිකාරී තනතුරේ වැඩ ආවරණය කළේ එක් අයෙකු පමණයි. ඒ ඉල්ලුම්කාරිය නේද?

උ. ඔව්.

මේ අනුව ඉල්ලුම්කාරිය වෙනුවෙන් පවත්නා යොමුවේ සඳහන් නිශ්චිත කරුණු මෙම සාක්ෂිකාරිය මගින් එනයින්ම අවබෝධ වන සේ සාක්ෂි දී ඇති බව පැහැදිලිය.

තවදුරටත් වගඋත්තරකාර පක්ෂයේ නීතිඥ මහතාට පිළිතුරු දුන් මෙම සාක්ෂිකාරිය මෙසේ තවදුරටත් ඉල්ලුම්කාරියගේ නඩුව ඔප්පු කිරීමට උත්සුකව ඇති බව පැහැදිලිය.

ප්‍ර. ආවරණ තනතුරක් ලබාදීමේ දී තනතුරු එකක් ලබා දීමට හැකියාවක් තිබෙන්නේ කියලා ලංකා ගමනා ගමන මණ්ඩලයේ චක්‍රලේඛනවල කොහේ හෝ සඳහන් වී තිබෙනවා ද?

උ. නැහැ.

(2011.10.05 දින කාර්යය සටහන් 11 පිටුව)

ඉන් පැහැදිලි වනුයේ වගඋත්තරකාර පාර්ශ්වය මෙම නඩුවේ යොමුවේ සඳහන් මෙහි ඉල්ලුම්කාරිය දිසා ගණකාධිකාරි තනතුරට කරන ලද ආවරණ පත්වීමක් තිබිය දී වෙනත් අයෙකු පත් කිරීම වරදක් නොවන බව ද මෙම සාක්ෂිකාරිය මගින් හෙළිකිරීමට යත්න දැරූ බවය.

නීති කෘතය අවසානයේ දෙපාර්ශ්වයට ලිඛිත දේශනය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන ලදී.

මෙම විභාගය තුළදී ඔප්පු වූ වැදගත් කරුණක් වූයේ මෙහි ඉල්ලුම්කාරිය දිසා ගණකාධිකාරි තනතුරේ ආවරණ රාජකාරියක් සඳහා පත්වීම ලබා සිටි බවත් වෙනත් කරුණු හේතුකොට ගෙන එකී තනතුර සඳහා වෙනත් කෙනෙකු පත් කිරීම හේතු කොටගෙන පළමුව කී මෙහි ඉල්ලුම්කාරියට තම තනතුර සහ වැටුප, ශ්‍රේණිය පහතට වැටුණු බවත් එකී සිද්ධීන් වසා ගැනීමට විනය පරීක්ෂණයක් පැවැත්වීම යන කඩතුරාව ප්‍රයෝජනයට ගත්ත ද වග උත්තරකාර ආයතනයේම අභියාචන මණ්ඩලය මගින් ඇයට පනවා තිබූ දඬුවම් සියල්ල ඉවත් කළ ද ඇයට තමා සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරන ලද සුදුසුකම් මත ගණකාධිකාරි තනතුරේ පුරප්පාඩුව පිරවීමට පියවර ගෙන නැති බවත් පැහැදිලිය.

ඉල්ලුම්කාරියගේ 2010.07.22 දිනැති දිවුරුම් ප්‍රකාශයෙන් ඇය අයැද ඇත්තේ 1997.10.24 දින සිට හිඟ වේතන රහිතව පඩි පාදයේ පිහිටුවා IIIබී ශ්‍රේණියට අදාළ වැටුප ලබාදෙන ලෙසය.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් බදුල්ල ගමනාගමන මණ්ඩලයේ දිසා ගිණුම් නිලධාරි තනතුරෙහි වැඩ ආවරණය කිරීම සඳහා වැඩ බැලීමේ දීමනාවක් සහිතව 1997.10.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි බදුල්ල බස් සමාගමට අනුයුක්තව සේවය කරන ටී. කේ. එම්. චන්ද්‍රාවතී මහත්මියට ලබා දුන් තනතුර 2002.07.22 දින සිට අහිමි කර වෙනත් අයෙකු එම තනතුරට පත් කිරීම හේතුවෙන් ටී. කේ. එම්. චන්ද්‍රවතී මහත්මියට කිසියම් අසාධාරණයක් සිදුව ඇති බැව් සාක්ෂි සහ සළකුණු කරන ලද ලේඛන ලිඛිත දේශන දිවුරුම් සහතික අනුව අනාවරණය වී ඇත.

එනම් ඉල්ලුම්කාරිය තමා දරමින් සිටි තනතුරට හා ශ්‍රේණියට අනුව පහත වැටුණු බවත් තමාට වැඩ ආවරණය කරන ලද දිසා ගණකාධිකාරි තනතුර අහිමිව වෙනත් කෙනෙකු එකී තනතුර සඳහා පත් කිරීමෙන් අගතියෙක් වූ බවත් හෙළි කළාය.

ඒ අනුව එසේ සිදු වූ බව විභාගයේ දී හෙළිවිය. එසේ හෙයින් මෙම බේරුම්කරනයේ ඉල්ලුම්කාරිය 1997.10.24 දින සිට හිඟ වැටුප් රහිතව අදාළ වැටුප් තලයේ පිහිටුවා IIIබී ශ්‍රේණියට පත් කිරීමට වගඋත්තරකාර පාර්ශ්වය පියවර ගත යුතු බවත් නිර්දේශ කරමි. මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ගැසට් පත්‍රයේ පළවී මසක් ඇතුළත ක්‍රියාත්මක කළ යුතු වේ.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්තිසහගත බව සහතික කරමි.

එස්. කාරියවසම්,
කාර්මික අධිකරණයේ බේරුම්කාර මණ්ඩලයේ සාමාජික.

2012 මාර්තු මස 28 වැනි දින දීය.

06 - 316

---

මගේ අංකය: IR/21/32/2006.

## කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

අංක 1733/21 දරන හා 2011/11/22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් වැල්ලම්පිටිය, කොලොන්නාව පාර, අංක 21 හි පදිංචි සමස්ත ලංකා තෙල් කම්කරු සමිතිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් වැල්ලම්පිටිය, නිමාව කොලොන්නාව හි සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක ඒ 3228 දරන හා 2011.10.06 දිනැති ප්‍රදානය අවලංගු කරන ලෙසට සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20 (1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක ඒ 3228 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2012/11/22 දින සිට අවසන් වන බවට පනතේ 20 (2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ.
කම්කරු කොමසාරිස්.

2012 මැයි මස 15 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

---

## 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත බේරුම්කරුවකුගේ තීරණයක්/ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

ලිපිනය - සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, කොලොන්නාව නිමාව, වැල්ලම්පිටිය.

"අ" ආකෘති පත්‍රය

2012.03.02

කම්කරු කොමසාරිස් වෙතටයි.

2011.11.22 දින අංක 1733/21 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ සමස්ත ලංකා තෙල් කම්කරු සමිතිය සහ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් බැඳී සිටින්නා වූ ද 2011.10.06 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. ඩී. පී. ධර්මවංශ,
මානව සම්පත් කළමණාකාර,
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,
කොලොන්නාව.

පිටපත් : සමස්ත ලංකා තෙල් කම්කරු සමිතිය,
අංක 21,
කොලොන්නාව පාර,
වැල්ලම්පිටිය.

06 - 317

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.